චක්‍රලේඛ අංක:- 06/2004

මගේ අංකය:- වප/සසේකො/ලෙ
සමුපකාර සේවක කොමිෂන් සභාව
අංක 50, කිතුල්වත්ත පාර, කොළඹ 08
2004.11.25

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

## විධිමත් විනය පරීක්ෂණවලදී පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම

විධිමත් විනය පරීක්ෂණ සඳහා පරීක්ෂණ නිලධාරීන් පත් කරනු ලැබීමේදී චූදිතයන් විසින් ඉදිරිපත් කෙරෙන විරෝධතා සහ අභියාචන පරීක්ෂණවලදී පෙනී යන විනිවිද බව හීන වීම හේතු කොට ගෙන මින් ඉදිරියට විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමේදී කොමිෂන් සභාව විසින් පරීක්ෂණ නිලධාරීන් පත් කිරීමට 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව සිදු කරනු ලැබේ.

02. මින් ඉදිරියට වැඩ තහනම් කිරීමට සිදු වූ කරුණු සහ මූලික විමර්ශන නිලධාරීන් ගේ නිර්දේශ සහ චෝදනා පත්‍ර කෙටුම්පතේ සහතික පිටපතක් ද සමග විධිමත් විනය පරීක්ෂණ සඳහා පරීක්ෂණ නිලධාරීන් පත් කරන ලෙස කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කළ යුතු ය. සුදුසු පරීක්ෂණ නිලධාරියකු කාරක සභාව විසින් නම් කර එවිය හැකිය. එහෙත් රෙගුලාසි මාලාවේ 93 වගන්තිය අනුව අවසාන තීරණය ගැනීම කොමිෂන් සභාව සතු වන්නේ ය.

03. කොමිෂන් සභාවේ නියමය පරිදි නිකුත් කරන ලදී.

ජේ. ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යතුමා ගේ සම්බන්ධීකරණ නිලධාරී.
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම් - සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ, කළුතර, ගම්පහ )
6. ලේකම් - සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තීය සමිති සංගම්.